# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 19/73

**ශ්‍රී කාණ්ඩයේ හඳුනාගැනීමේ අංක සහිත පෞද්ගලික රථ සම්බන්ධයෙන් අය කිරීමක් පැනවීම පිණිස ද 1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සහ එයට ආනුෂංගික හෝ සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 47 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

## I වන කොටස

## ශ්‍රී කාණ්ඩයේ හඳුනාගැනීමේ අංක සහිත පෞද්ගලික රථ සම්බන්ධයෙන් අය කිරීමක්

**2.** ශ්‍රී කාණ්ඩයේ හඳුනාගැනීමේ අංකයක් පවරනු ලැබූ පෞද්ගලික රථයක 1972 නොවැම්බර් මස 10 වන දින දී ලියාපදිංචි කළ අයිතිකරුව සිටි සෑම තැනැත්තකු ම සහ එකී දිනට පසු පෞද්ගලික රථයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ මෝටර් වාහනයක පළමු වන අයිතිකරු ලෙස ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකු ම, 3 (1) වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි සහ මේ පනත යටතේ ඒ වෙනුවෙන් සාදනු ලබන යම් නියෝගවලට අනුකූලව (මෙහි මින් මතු "අය කිරීම" යනුවෙන් හඳුන්වනු ලබන) අය කිරීමක් ගෙවිය යුතු ය : *අය කිරීම පැනවීම.*

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන—

(1) මෝටර් වාහන පනතේ 31 (4) වන වගන්තිය යටතේ ආදායම් බලපත්‍ර ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් කරනු ලැබූ යම් තැනැත්තකුට ; සහ

(2) 1972 නොවැම්බර් මස 10 වන දිනට පෙර පෞද්ගලික රථයේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරනු ලැබ, මෝටර් වාහන රෙජිස්ට්‍රාර් විසින් ඒ ඉල්ලීම පිට වාහනයේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී ඒ තැනැත්තාට

අදාළ නො වන්නේ ය.

**3.** (1) 1973 දෙසැම්බර් මස 31 වන දින දී හෝ ඊට පෙර නැත හොත් වාහනය පෞද්ගලික රථයක් වශයෙන් පළමු වරට ලියාපදිංචි කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ගෙවී යාමට පෙර යම් දිනයක දී හෝ මෙකී දින දෙකෙන් යම් දිනයක් පසුව එළඹේ ද ඒ දිනයේ දී හෝ එම අය කිරීම නියමිත බලපත්‍ර අධිකාරිට ගෙවිය යුතු ය : **අය කිරීම ගෙවිය යුතු දිනය හා දණ්ඩන**

1—ඒ —02184 10,882 (73/09)

එසේ වුව ද 1973 දෙසැම්බර් මස 31 වන දින වෙනුවට ඊට පසුව එළඹෙන දිනයක් නියම කිරීම අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි අමාත්‍යවරයාට පෙනී ගියහොත් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ඔහු විසින් එවැනි දිනයක් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය අනුව එම අය කිරීම ගෙවිය යුතු දිනයෙහි හෝ ඊට පෙර එය ගෙවීම පැහැර හරින සෑම තැනැත්තකු ම—

(අ) අය කිරීමේ මුදලෙන් සියයට විස්සක ප්‍රමාණයක දණ්ඩන මුදලක් නියමිත බලපත්‍ර අධිකාරීට ගෙවීමට යටත් විය යුතු ය ; තවද,

(ආ) මේ පනත යටතේ වරදකරුවකු විය යුතු ය.

(3) මේ පනත යටතේ වරදකරුවකු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය අනුව එම අය කිරීම ගෙවීමට නියමිත දිනයේ සිට මාස තුනක කාලයක් ගත වීමට පෙර අය කිරීමේ මුදල සහ (2) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ දඩ මුදල නියමිත බලපත්‍ර අධිකාරීට ගෙවනු නො ලැබූ අවස්ථාවක දී, නියමිත බලපත්‍ර අධිකාරී විසින්, එම අය කිරීමේ සහ දඩයේ විස්තර ද එම අය කිරීම සහ දඩය ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ නම සහ ඔහු පදිංචිව සිටි බවට අන්තිමට දැන සිටි ස්ථානය සඳහන් සහතිකයක්, එම ස්ථානය පිහිටි කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරන ලද දණ්ඩන නියමයකින් පනවනු ලැබූ දඩයක් වූවාක් මෙන් එම අය කිරීම සහ දඩය අය කර ගැනීමට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කළ යුතු ය.

අය කිරීම ගෙවිය යුතු වාහනවල අලුත් අයිතිකරුවන් ලියාපදිංචි කිරීම.

4. 2 වන වගන්තිය යටතේ අය කිරීමක් ගෙවිය යුතු මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ඒ අය කිරීම සහ ඒ අය කිරීම ගෙවීම පැහැර හැරීම සඳහා යම් දඩයක් වේ නම් එය ද යථා පරිදි ගෙවනු ලැබුවහොත් මිස, ඒ මෝටර් වාහනයේ අලුත් අයිතිකරු වශයෙන් මෝටර් වාහන පනත යටතේ කිසි ම තැනැත්තකු ලියාපදිංචි නො කළ යුතු ය.

නියෝග.

5. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යෙදවීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අය කිරීම ගෙවිය යුත්තේ යම් ප්‍රමාණ අනුව ද, ඒ ප්‍රමාණ සඳහා හෝ සම්බන්ධයෙන්, (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නො වන පරිදි, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සාදනු ලබන කිසිදු නියෝගයක්, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, බල නො පැවැත්විය යුතු ය.

6. මේ කොටසේ— *අර්ථ නිරූපණය.*

"අමාත්‍යවරයා" යන්නෙන් අග්‍රාමාත්‍යවරයා විසින් මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහ බලපත්‍ර නිකුත් කිරීමේ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වේ.

"ලියාපදිංචි කරනු ලැබූ" යන්නෙන් මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කර තිබීම අදහස් වේ.

"හඳුනාගැනීමේ අංකය", "බලපත්‍ර අධිකාරී" සහ "පෞද්ගලික රථය" යන යෙදුම්වල මෝටර් වාහන පනතේ පිළිවෙලින් දී ඇති අර්ථ ම ඇත්තේ ය.

## II වන කොටස

### 1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම

7. 152 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය 1963 අංක 11 දරන මුදල් පනතේ XII වන කොටසේ 152අ වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :— *1963 අංක 11 දරන පනතේ 152අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*"අපනයනය කරනු ලැබූ භාණ්ඩ වෙනුවෙන් ගෙවනු ලැබූ ව්‍යාපාර පිරිවැටුම් බද්ද අපනයන කරුට ආපසු ගෙවීම.*

152අ. (1) (මින් මතු මේ වගන්තියේ "අපනයනකරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තකු විසින් යම් භාණ්ඩයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ විට දී—

(අ) එම භාණ්ඩය ශ්‍රී ලංකාවේ නිපදවනු ලැබූ බවට හෝ සාදනු ලැබූ බවට හා එම භාණ්ඩය සාදන්නාගෙන් හෝ නිපදවන්නාගෙන් අපනයන කරන්නා විසින් මිලදී ගත් බවට ;

(ආ) එම භාණ්ඩය මිලදී ගැනීම සඳහා අපනයන කරු විසින් ගෙවනු ලැබූ මිල, ඒ සාදන්නාගේ හෝ නිපදවන්නාගේ ව්‍යාපාර පිරිවැටුමෙහි කොටසක් වන බවට ; සහ

(ඇ) ඒ සාදන්නා හෝ නිපදවන්නා විසින් ඔහුගේ ව්‍යාපාර පිරිවැටුම සම්බන්ධයෙන් ඇත්ත වශයෙන්ම ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවනු ලැබූ බවට

කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, ඒ භාණ්ඩ සාදන්නා හෝ නිපදවන්නා විසින් ඒ ව්‍යාපාරයේ පිරිවැටුම පිළිබඳව ගෙවනු ලැබූ ව්‍යාපාර පිරිවැටුම් බදු මුදලෙහි යම් ප්‍රමාණයක් ඒ භාණ්ඩය සඳහා අපනයනකරු විසින් ගෙවනු ලැබූ ගැනුම් මිලෙහි ඇතුළත් ව ඇතැයි දැක්විය හැකි වේ ද ඒ මුදල කොමසාරිස්වරයා විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව අපනයනකරුට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් භාණ්ඩයක් අපනයනය කරනු ලබන්නේ යම් භාජනයක, දරනයක හෝ දවටනයක ද, එම උපවගන්තියෙහි විධිවිධානවල "භාණ්ඩය" පිළිබඳ ව ඇති සියලු සඳහන් කිරීම් අවස්ථාවෝචිත පරිදි, එකී භාජනය, දරනය හෝ දවටනය සම්බන්ධ සඳහන් කිරීමක් වූවාක් මෙන් ඒ භාජනය, දරනය හෝ දවටනය සම්බන්ධයෙන් එකී උපවගන්තියෙහි විධිවිධාන අදාළ වන්නේ ය.

(3) භාණ්ඩයක් අපනයනය කිරීමෙන් පසු මාස තුනකට කලින් නො වූ දිනක දී සහ මාස නවයක් ගතවීමට පෙර, එම භාණ්ඩයේ අපනයනකරු විසින්, ගෙවීම සඳහා ලියවිල්ලකින් ඉල්ලීමක් කරනු ලැබුවහොත් මිස, යම් භාණ්ඩයක් හෝ යම් භාණ්ඩයක් සහ එම භාණ්ඩය අපනයනය කරනු ලබන භාජනයක්, දරනයක් හෝ දවටනයක් පිළිබඳ ව (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කිසිදු ගෙවීමක් නො කළ යුතු ය.'.